// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1979/22 - 2016 අගෝස්තු මස 09 වැනි අඟහරුවාදා - 2016.08.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/10/45/2011

### කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2014.11.03 දිනැති හා අංක 1887/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2014.10.13 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අතුරුගිරිය, සමනල මාවත, අංක 46/13 හි පදිංචි එන්. එදිරිසිංහ මයා/අතුරුගිරිය, මයිලංගම පාර, අංක 75/4 හි පදිංචි එච්. ජී. ටියුරින් තිලකරත්න මහතා ඇතුළු සේවකයන් 10 දෙනෙකු හා අනෙක් පාර්ශ්වය වශයෙන් අතුරුගිරිය, ඔරුවල, කඩුවෙල පාර හි පිහිටි සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2016.04.22 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 අගෝස්තු මස 02 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/10/45/2011

කාර්මික අධිකරණයේ දී ය.

01. එන්. එදිරිසිංහ මහතා,
අංක 46/13, සමනල මාවත,
අතුරුගිරිය.

02. එච්. ජී. ටියුරින් තිලකරත්න මහතා,
අංක 75/4, මයිලංගම පාර,
අතුරුගිරිය,
(ඇතුළු සේවකයින් 10 දෙනෙකු)

එක් පාර්ශ්වයක් වශයෙන්ද :

නඩු අංකය : ඒ/3586

අනෙක් පාර්ශ්වය වශයෙන් :

සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ්
කඩුවෙල පාර,
ඔරුවල,
අතුරුගිරිය.

ප්‍රදානය

කම්කරු හා කම්කරු සබඳතා ඇමති වන ගාමිණී ලොකුගේ මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශෙෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අනපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඔහුගේ 2014.10.13 දිනැති නියෝගයෙන් මා පත් කර ඇත.

ඉහත කී පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ :

සීමාසහිත ලංකා වානේ සංස්ථාව හා සිලෝන් හෙවි ඉන්ඩස්ට්‍රීස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් කම්පැනි ලිමිටඩ් (වර්තමාන නාමය - සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ්) අතර 1996 ඔක්තෝබර් මස 31 වන දින ඇති කර ගන්නා ලද ගිවිසුමේ කොන්දේසි වලට අනුව 1975 වර්ෂයට පෙර සංස්ථා සේවයට බැඳී පසුව ඉහත කී සමාගමේ සේවය සඳහා අන්තර්ග්‍රහණය කරනු ලැබූ පහත නම් සඳහන් සේවකයින් දහ දෙනා (10) වසර දෙකක කාල සීමාවක් සඳහා සමාගම යටතේ අඩු වරප්‍රසාද යටතේ කොන්ත්‍රාත් පදනම මත සේවයෙහි යෙදීම හේතුවෙන් එම නම් සඳහන් සේවකයින් හට යම් අසාධාරණයක් සිදුවුයේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුවුයේ නම් ඔවුන් එකිනෙකාහට සමාගම වෙතින් කුමන සහනයක් හිමිවිය යුතු ද යන්න පිළිබඳව වේ.

1 A – G 24007 — 31 (2016/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**සේවක නාම**

01. එන්. එදිරිසිංහ මහතා
02. එච්. ඩී. ටියුරින් තිලකරත්න මහතා
03. ජී. විමලදාස මහතා
04. කේ. සරත් පෙරේරා මහතා
05. එච්. ආනන්ද මහතා
06. පී. උපාලි නන්දසිරි මහතා
07. ඒ. ජයසේන මහතා
08. පී. හෙට්ටිආරච්චි මහතා
09. කේ. එස්. මායාදුන්න මහතා
10. ඒ. ඩී. ධර්මපාල මහතා

මෙහි අංක 3 හි නම් සඳහන් ජී. විමලදාස මහතා ඔහුගේ ඉල්ලීම ඉවත් කර ගන්නා ලදී.

දෙපාර්ශ්වය විසින් බේරුම්කරණයට ඉදිරිපත් කරන ලද ප්‍රකාශ, පිළිතුරු ප්‍රකාශ සහ ලියවිලි ඉදිරිපත් කිරීමෙන් පසු කවර පාර්ශ්ව විසින් ප්‍රථමයෙන් සාක්ෂි මෙහෙය වීම කළ යුතු දැයි කෙටි සාකච්ඡාවකින් පසුව වග උත්තරකාර ආයතනය විසින් ප්‍රථමයෙන් සාක්ෂි මෙහෙය වන ලෙස වගඋත්තරකාර පාර්ශ්වයට මා විසින් භාර දෙන ලදී. 2013 කාර්මික අධිකරණ සංශෝධන පනත අනුව මෙවැනි පරීක්ෂණ මාස 4 ක් ඇතුළත අවසන් කළ යුතු බැව් සඳහන් කර ඇති බැවින්ද එම කාලසීමාව කිසිසේත් ප්‍රමාණවත් නොවන බැවින්ද දෙපක්ෂයට එය තේරුම් ගෙන තිබීම මෙම පරීක්ෂණය ප්‍රමාදයකින් තොරව ආරම්භ කිරීමට හැකිවිය.

ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් වෘත්තීය සමිති උපදේශක ඇස්. පී.විජයමාන්න මහතා පෙනී සිටි අතර වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ දිනූෂ මිරිහාන, මහත්මියගේ උපදෙස් පිට නීතිඥ චතුර ගල්හේන මහතා පෙනී සිටියේ ය.

වග උත්තරකාර පාර්ශ්වය එනම් සිලෝන් ස්ටීල් කෝපරේෂන් සමාගමේ මානව සම්පත් කළමනාකාර ගෞරි බිමල්කා කරවිට මහත්මියගේ සාක්ෂිය ආරම්භ කරන ලදී.

කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරී මගින් බේරුම්කරණයට ඉදිරිපත් කරන ලද ඉල්ලුම්කාර පාර්ශ්වයේ ප්‍රථම ප්‍රකාශයේ මෙසේ සඳහන් වේ.

සංස්ථාවේ මුල සිටම ක්‍රියාත්මක වූයේ වයස අවුරුදු 60 සම්පූර්ණ වීමෙන් පසු විශ්‍රාම ගැන්වීමේ ප්‍රතිපත්තියයි. 1975 අප්‍රේල් මස 04 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 95 න් පසු එවකට සංස්ථාව අයත් වූ කර්මාන්ත සහ විද්‍යා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය මගින් 1975.12.15 දිනැති අංක 263 දරන චක්‍ර ලේඛයට අනුව ඒ වන විට සේවයේ යෙදී සිටි සංස්ථා සේවකයින්ට වයස අවුරුදු 60 එළඹෙන තෙක් සේවයේ යෙදී සිටීමට ඉඩ සලසා ඇති බැව් පෙනේ.

එසේ වුවත් ඉහත චක්‍ර ලේඛයේ අංක 3, 4 සහ 5 වගන්ති කියවා බැලීමේදී පැහැදිලි වන්නේ බොහෝ අවස්ථාවන් හිදී අවුරුදු 58 න් ඔබ්බට සේවය දීර්ඝ කිරීමේදී නොයෙකුත් අවහිරතා සහ බාධා පනවා තිබුණ බවයි. එවන් ඇතැම් අවස්ථාවන්හිදී අදාළ ඇමතිවරයාගේ සහ බොහෝ විට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියද ලබා ගැනීම අවශ්‍ය වූ බවයි. චක්‍ර ලේඛයේ 5 වෙනි ඡේදය කියවා බැලීමේදී මේ තත්වය පැහැදිලි වේ.

වග උත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් එක් එක් සේවකයින් 9 දෙනාගේ ලිපි ලේඛන ඉදිරිපත් කරමින් මානව සම්පත් කළමනාකාරිණිය, ගෞරි බිමල්කා කරවිට මහත්මිය දීර්ඝ සාක්ෂියක් දී ඇත. මේ නිලධාරිණියගේ සාක්ෂිය අනුව අවුරුදු 58 සිට 60 දක්වා සේවා දීර්ඝ කිරීමට අදාළ RI ලේඛනයේ මෙසේ සඳහන් වේ.

"Those employees who joined in service before 4th April 1975 and retired on Completion of 58 years should be offered contract employment and continue till they reach the age of 60 years. These contracts will be renewed every year as per collective agreement signed on 1st February 2002 by CHICO and SHNSS"

එන්. එදිරිසිංහ සහ අනෙකුත් සේවකයින් R24 ලිපිය අවසානයේ දී

"I accept the fact that the contract will cease to operate from 12th June 2009"

යොමුවේ අනෙකුත් සේවකයින් 8 දෙනාද අදාළ ලේඛනයේ කෙළෙවර කරුණු වටහා ගෙන අත්සන් තබා ඇත.

නීතිඥ චතුර ගල්හේන මහතා ඔහුගේ ලිඛිත දේශනයේ මෙසේ සඳහන් කර ඇත.

''සේවකයින් සියළු දෙනා විශ්‍රාම ගැනීමෙන් අනතුරුව කිසිදු විරෝධතාවයකින් තොරව කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවීමට සිය කැමැත්ත පළකොට ඇති අතර එකී සියළු කොන්ත්‍රාත් පත්වීම ලිපිවල අවසානයේ සියළු කොන්දේසි වලට එකඟ වෙමින් සේවකයින් විසින් අත්සන් කොට ඇත.'' (පරීක්ෂණ සටහන 312 පිටුව)''

''එකී සේවකයින් සියළු දෙනා විශ්‍රාම ගැනීමෙන් අනතුරුව කිසිදු විරෝධතාවයකින් තොරව කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදීමට සිය කැමැත්ත පළකොට ඇති අතර එකී සියළු කොන්ත්‍රාත් පත්වීම් ලිපිවල අවසානයේ සියළු කොන්දේසි වලට එකඟ වෙමින් සේවකයින් අත්සන් කොට ඇත.'' (312 පිටුව)

යොමුවේ සඳහන් සේවකයින් 9 දෙනාම ඔවුන්ගේ කොන්ත්‍රාත් කාලය අවසන් කිරීමේ ලිපිවල සේවය අවසන් කිරීමේ අදහස පළකර ඇති බැව් පැහැදිලි වේ. සේවක ජී. විමලදාස මහතා මෙම නඩුවට සම්බන්ධ නොවීමට තීරණය කොට නඩුවෙන් අයින් වී ඇත්තේ නියම තත්වය වටහා ගැනීමෙන් පසුව බවද හෙළි වී ඇත.

මෙම නඩුවේ සේවකයින් නම දෙනාගේ කිසිවෙකු ඔවුනට අඩු වරප්‍රසාද ගැන කිසිම ලියවිල්ලක් හෝ පැමිණිල්ලක් හෝ සමාගමට ඉදිරියේ නැති අතර R27 සිට R40 දක්වා ඇති කිසිම ලියවිල්ලක්ද එවැනි සැකයක් හෝ බියක් හෝ පළකර නැත.

1975.04.07 දිනයට පෙර සේවයට බැඳුන සේවකයින් අවුරුදු 58 සිට 60 දක්වා කොන්ත්‍රාත් පදනම මත සේවය කිරීමෙන් පසු විශ්‍රාමයට පත්වන බව R1 නිවේදනයෙන් සේවකයින් දැනුවත් කර ඇත. ඒ බැව් ඔවුන් කල්තියා දැන සිටි බැව් පැහැදිලි වේ.

වගඋත්තරකාර පාර්ශ්වයේ නීතිඥතුමන් පසු අවස්ථාවකදී පෙන්වා දුන් පරිදි මීට පෙර බේරුම්කරණ අංක A3291 යටතේ සහ වත්මන් නඩුවේ එනම් අංක 3586 යන නඩු දෙකේ සමාන නඩු නොවේ. සිද්ධිමය කරුණු සහ සේවකයින් ද වෙනස්ය. A3291 නඩුවේ සේවකයින් 45 කු සිට ඇතත් වර්තමාන නඩුවේ සේවකයින්ගේ ගණන 9ක් පමණි.

වගඋත්තරකාර පාර්ශ්වයේ නීතිඥවරයාගේ ලිඛිත දේශනයේ පහත සඳහන් කරුණු කෙරෙහි ද මාගේ අවධානය යොමු විය.

1. කොන්ත්‍රාත් පදනම මත සේවය යෙදීමට කැමැත්ත පළකොට ඇති ලිපි ලේඛන වල වැටුප් සහ සේවා කොන්දේසි පිළිගන්නා බවට සේවකයින් ප්‍රකාශිතව පිළිගෙන අත්සන් තබා තිබියදී විශ්‍රාම ගැනීමෙන් වසර කීපයකට පසුව එකී කරුණු නැවත අභියෝගයකට ලක් කිරීම පිළිගත් කම්කරු නීති සම්ප්‍රදායට අනුකූල නොවේ.

11. විශ්‍රාමයාමෙන් පසු සේවකයින් කීප දෙනෙකුට තවත් වසර දෙකක් සේවය කිරීමේ අවස්ථාව ලබා ගැනීමට වෑයම් කිරීම සේවා යෝජක සමාගම අපහසුතාවයකට ලක් කිරීමක් ලෙස සැලකේ.

ඉහත සඳහන් සියළු කරුණු සාධාරණ ලෙස විශ්ලේෂණය කිරීමෙන් පසු වැඩ බලන කම්කරු කොමසාරිස් විසින් 2014.10.13 දින අත්සන් තබන ලද යොමුවේ නම්කර ඇති සේවකයින් දහ (10) දෙනා වසර දෙකක කාලසීමාවක් සඳහා සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ් සමාගමේ වසර දෙකක කාල සීමාවක් සඳහා සමාගම යටතේ අඩු වරප්‍රසාද යටතේ කොන්ත්‍රාත් පදනම මත සේවයෙහි යෙදවීම හේතුවෙන් එම නම් සඳහන් සේවකයින් දස දෙනාට අසාධාරණයක් සිදුවී නැති බැවි මා පිළිගන්නා බැවින් ඔවුන්ට සහනයක් ලබා දීම මම ප්‍රතික්ෂේප කරමි. මෙම ප්‍රදානය සාධාරණ සහ යුක්තිසහගත බව මගේ නිගමනයි.

නීතිඥ ටී. පියසෝම,
බේරුම්කරු.

2016.04.22

08 - 659

---

මගේ අංකය : 1R/10/06/2012

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2012.12.17 වැනි දිනැති හා අංක 1789/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2012.11.20 වැනි දින දරන නියෝගයෙන් එක් පාර්ශ්වයක් වශයෙන් මොරටුව, උයන පාර, අංක 139හි පදිංචි ජේ. එස්. පී. කොස්තා මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 01, චෛත්‍ය පාර, අංක 19හි පිහිටි ශ්‍රී ලංකා වරාය අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2016.03.31 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 අගෝස්තු මස 02 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කාර්මික අධිකරණයේ දී ය**

යොමු අංකය : 1R/10/06/2012

එක් පාර්ශවයක් වශයෙන්

ජේ. එස්. පී. කොස්තා මයා,
අංක 139, උයන පාර,
මොරටුව.

නඩු අංකය : A3482

අනෙක් පාර්ශවය වශයෙන්

ශ්‍රී ලංකා වරාය අධිකාරිය,
අංක 19, චෛත්‍යය පාර,
කොළඹ 01.

**ප්‍රදානය**

වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ගරු කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මැතිතුමාට පැවරී ඇති බලතල අනුව ඉහත පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුල් බේරුම්කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු ලෙස 2012.11.20 වැනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

දෙපාර්ශ්වය අතර පවතින ආරාවුල මෙසේය.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ, අධිකාරි විද්‍යුත් විධායක (IV ශ්‍රේණිය) ලෙස සේවය කරන ලද ජේ. එස්. පී. කොස්තා මහතාට 2006 වර්ෂයේ දී වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා පිහිටුවන ලද වරාය අධිකාරියේ වැටුප් හා සේවක කමිටුවේ නිර්දේශය අනුව 2006.01.01 දින සිට අධිකාරි විද්‍යුත් (II ශ්‍රේණිය) තනතුර හා JLM වැටුප් තලය ලබා නොදීම හේතුවෙන් ඔහුට යම් අසාධාරණයක් සිදු වූයේ ද යන්න හා එසේ වූයේ නම් හිමි විය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.

ඉහත ආරාවුලට අදළව දෙපාර්ශ්වය විසින් ප්‍රකාශ ගොනු කිරීමෙන් අනතුරුව පළමු පාර්ශ්වය විසින් ප්‍රති උත්තරයක් ගොනු කර තිබිණ. ඊට ද දෙවන පාර්ශ්වය ප්‍රකාශයක් ඉදිරිපත් කර තිබිණි.

ඉල්ලුම්කාර පාර්ශ්වය සාක්ෂි මෙහෙයවීම ආරම්භ කරමින් ඉල්ලුම්කරුට ප්‍රථමයෙන් සාක්ෂියට කැඳවන ලදී. ඉන් අනතුරුව ඉල්ලුම්කාර පාර්ශවය ස්වාධීන වරාය සේවක සංගමයේ උපලේකම්වරයා වන හෙට්ටි ආරච්චිගේ දෙන් සිරිසේන මහතා සාක්ෂියට කැඳවීමෙන් අනතුරුව සාක්ෂි මෙහෙයවීම අවසන් කරමින් A1 සිට A17 දක්වා ලකුණු කරන ලද ලේඛන අතරින් A14 ලේඛනය නොමැතිව ලිඛිත සැලකිරීම බේරුම්කරණය වෙත භාර දෙන ලදී. A14 වශයෙන් ලේඛනයක් ලකුණු කොට නොමැති බව ඉල්ලුම්කාර පාර්ශ්වය සිය ලිඛිත දේශනයේ සඳහන් කර තිබිණ.

පළමු පාර්ශ්වය සිය සාක්ෂි මෙහෙයවීම අවසන් කිරිමෙන් පසුව දෙවන පාර්ශ්වය සාක්ෂි ආරම්භ කරමින් තුසිත් රොෂාන් ඇලපාත වන මානව සම්පත් කළමනාකරු සාක්ෂියට කැඳවීමෙන් අනතුරුව සිය සාක්ෂි මෙහෙයවීම අවසන් කරමින් ලකුණු කරන ලද R1 සිට R16 දක්වා ලේඛන සමග ලිඛිත සැලකිරීම් බේරුම්කරණයට ඉදිරිපත් කර ඇත.

ඉල්ලුම්කරු ඉහත වගඋත්තරකරු යටතේ 1979.12.21 දින සිට සේවයට බැඳී තිබුණ බව ද ඉන් අනතුරුව 1985.04.03 දින ශිල්පී විද්‍යුත් හා විදුලි සංදේශ I පංතියේ I ශ්‍රේණියට උසස්වීමක් ලැබී තිබු බව ද පසුව පිළිවෙලින් 1998.10.20 දින සිට ජ්‍යෙෂ්ඨ ශිල්පී වශයෙන් ද 2005.10.13 දින සිට සහකාර අධිකාරී වශයෙන් ද ඉන් අනතුරුව 2009.08.07 වැනි දින සිට අධිකාරි විද්‍යුත් විධායක IV ශ්‍රේණිය ලබා දී තිබූ බව වගඋත්තරකරු සඳහන් කර තිබිණි. ඉහත උසස්වීම් ලබා දුන් බව ඉල්ලුම්කරු පිළිගෙන තිබිණ.

වගඋත්තරකාර අධිකාරියේ වැටුප් ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු කොට 2006.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කර තිබූ බව දෙපාර්ශ්වය ඉදිරිපත් කරන ලද සාක්ෂි අනුව තහවුරු විය.

ඉල්ලුම්කරු සිය කරුණු ඉදිරිපත් කරමින් වැටුප් ප්‍රතිව්‍යුහගත කරන ලද කමිටුව 2006.01.01 දින සිට අධිකාරි විද්‍යුත් II ශ්‍රේණිය ලබා දීමට නියම කර තිබූ බව ද ඊට අදළ (A3a) හා A3b ලෙස ලකුණු කොට බේරුම්කරණයට ඉල්ලුම්කරු ඉදිරිපත් කර තිබිණ. ඉහත පරිදි නිර්දේශ කර තිබු බව වගඋත්තරකරු ඉදිරිපත් කල සාක්ෂි අනුව ද තහවුරු විය. ඉහත නිර්දේශය ක්‍රියාත්මක කිරිමේදී විවිධ ගැටලු මතු වූ බව ද ඒ අනුව නොසන්සුන්තාවයක් ඇතිවීම හේතු කොට ගෙන නැවත ඉහත නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩල නියෝගයක් අනුව කමිටුවක් පත් කළ බව ද ඊට අදලව ලේඛනයක් ඉල්ලුම්කරු විසින් A3 වශයෙන් ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණ. ඉහත සම්පූර්ණ වාර්තාව දෙපාර්ශ්වය විසින්ම බේරුම්කරණයට ඉදිරිපත් කර නොතිබූ අතර මෙම සිද්ධියට බලපාන ඡේද පමණක් බේරුම්කරුට ඉදිරිපත් කොට දෙපාර්ශ්වයම බේරුම්කරණයට කරුණු ඉදිරිපත් කර තිබිණ.

ඉල්ලුම්කරුට 2006.01.01 දින සිට බල පැවැත්වෙන පරිදි අධිකාරි විද්‍යුත් II ශ්‍රේණිය ඉල්ලුම්කරුට ලබා දෙන ලෙස වැටුප් ප්‍රතිශෝධන කමිටුව නිර්දේශ කර තිබූ බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය.

ඉහත නිර්දේශය පරිදි අධිකාරි විද්‍යුත් විධායක II ශ්‍රේණිය 2006.01.01 දින සිට ක්‍රියාත්මක වී නොතිබූ බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව තහවුරු විය. 2006.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කර තිබූ යෝජනා සම්බන්ධව සේවකයින් අතර නොසන්සුන්තාවයක් ඇතිව තිබූ බව වගඋත්තරකරු සඳහන් කළ අතර එම කරුණ ඉල්ලුම්කරුගේ සාක්ෂියේ දී ද සඳහන් කර තිබුණ. ඉහත නිර්දේශ සම්බන්ධව නැවත සොයා බැලීමට කමිටුවක් පත් කළ බව වගඋත්තරකරු සඳහන් කළ අතර එය නිවැරදි බව ඉල්ලුම්කරු බේරුම්කරණයට ඉදිරිපත් කරන ලද A3 ලේඛනය මගින් ද තහවුරු වේ.

ඉහත කමිටුව ගත් සම්පූර්ණ වාර්තාව බේරුම්කරණයට ඉදිරිපත් නොවූ අතර එකී ලේඛනය වගඋත්තරකරු භාරයේ පවතින ලේඛනයක් බව ද පිළිගත හැකිය. ඉහත කමිටුව විසින් කරන ලද නිර්දේශයන් මත ඉල්ලුම්කරුට 2009.08.09 දින සිට අධිකාරි විද්‍යුත් විධායක IV ශ්‍රේණිය ලබා දුන් බවට වගඋත්තරකරු කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර තිබුණි.

වගඋත්තරකරු ඉහත තීරණයට අදළව ගන්නා ලද ලේඛන R13, R14, R15 වශයෙන් ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබුණි. ප්‍රධාන මානව සම්පත් කළමනාකරු විසින් 2009.06.19 දින ඉදිරිපත් කරන ලද ''BOARD MEMORANDUM '' පත්‍රය R13 වශයෙන් ද එකී ලේඛනයට ඇමුණුම් වශයෙන් ලේඛන 3ක් ඉදිරිපත් කර තිබෙන බව වගඋත්තරකරු ලකුණු කරන ලද R13 අනුව අනාවරණය වේ. එකී ලේඛන අතරින් දෙවැනි ඇමුණුම් R14 වශයෙන් ද, III ඇමුණුම් R15 වශයෙන් ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණ. III ඇමුණුම් ඔප්පු කිරීමට යටත්ව ලකුණු කරන ලෙස ඉල්ලුම්කරු ඉල්ලා ඇතත් ඉහත ලේඛනය නිරීක්ෂණය කිරිමේ දී එකී ලේඛනය ද අදළ දින ඉදිරිපත් කරන ලද ලේඛනයේ බව පිළිගත හැකිය.

ඉහත ලේඛන අනුව ඉල්ලුම්කරුට අදළ උසස්වීම අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක වන බවට තීරණයක් ගෙන තිබූ බව ද ඒ අනුව ඉල්ලුම්කරුට අදළ උසස්වීම් 2009.08.07 දින ලබා දුන් බවට වගඋත්තරකරු කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර තිබිණ.

එම තීරණය හේතු කොටගෙන තමාට අසාධාරණයක් සිදු වූ බව ද දීර්ඝ සේවා කාලය අනුව නියමිත පරිදි උසස්වීම් නොලැබීම යන කරුණු සලකා බලා 2006.01.01 දින සිට ඉහත තනතුර ලබා දීමට නිර්දේශ කර තිබූ බව ද ඉල්ලුම්කරු සිය කරුණු ඉදිරිපත් කරමින් කියා තිබුණි. 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරී පනතේ 07 වගන්තිය යටතේ අධිකාරිය සතු බලතල දක්වෙන ලේඛනය වගඋත්තරකරු R01 වශයෙන් ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබුණි. වරාය අධිකාරියේ සේවකයින් නිලධාරීන් සේවයෙහි නියුක්ත කරලීම, එසේම එම සේවකයින්, නිලධාරීන් උසස්කිරීම්වලට අදළ රීති සැකසිය හැකි බවද වගඋත්තරකරු ඉහත පනතේ 7 වගන්තිය සඳහන් කරමින් කරුණු ඉදිරිපත් කර තිබුණි. එම කරුණු බේරුම්කරණයේදී හබයට ලක් නොවුණි. ඒ අනුව ඉහත වගන්තිය අනුව රීති සැදීමේ බලය තිබෙන බව පිළිගත හැකිය.

ඉල්ලුම්කරු 1979.12.21 දින සිට I පංතියේ II ශ්‍රේණියේ ගුවන්විදුලි යාන්ත්‍රික ලෙස සේවයට බැඳී තිබූ බව R4 ලේඛනය අනුව පිළිගත හැකි අතර ඉන් පසුව 1985.04.03 දින සිට ශිල්පී විද්‍යුත් 1 පංතියේ 1 ශ්‍රේණියට ද ඉන් අනතුරුව 1998.10.20 දින සිට ජ්‍යෙෂ්ඨ ශිල්පී ලෙස ද පසුව සහකාර අධිකාරී 2005.10.13 දින සිට පත්ව ඇති අතර 2009.08.07 දින සිට අධිකාරි විද්‍යුත් විධායක

IV ශ්‍රේණියට පත්ව තිබෙන බවට වගඋත්තරකරු සඳහන් කර තිබූ කරුණු ඉල්ලුම්කරු ප්‍රතික්ෂේප කොට නොතිබුණි. ඉහත වගඋත්තරකරු යටතේ ඉල්ලුම්කරු සේවය කරමින් සිටිය දී අභ්‍යන්තර ඉල්ලුම්පත් කැඳවීමක් කළ බව ද ඒ අනුව අධිකාරී (විද්‍යුත්) විධායක IV ශ්‍රේණිය තනතුරට 2003.11.05 දින දන්වීම පරිදි තමා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ බව ද එම දැන්වීම පරිදි අදළ තනතුරට කිසිවෙකු බඳවා ගැනීමක් නොකල බව ද ඉන් පසුව 2004.11.22 දිනෙන් යුතුව දැන්වීමක් තිබූ බව ද ඒ අනුව ඉල්ලුම්කරු ඉල්ලුම් පත්‍රයක් යොමු කළ බව ද එම අවස්ථාවේ දී ද කිසිදු බඳවා ගැනීමක් නොකළ බව ද A1 හා A2 ලේඛණ ඉදිරිපත් කරමින් ඉල්ලුම්කරු කරුණු ඉදිරිපත් කර තිබුණි. ඉහත ඉල්ලුම්පත් කැඳ වූ දැන්වීම් වගඋත්තරකරු ප්‍රතික්ෂේප කොට නැති අතර තනතුරට නියමිත සුදුසුකම් දක්වා තිබෙන බව පිළිගත හැකිය. ඉල්ලුම්කරුට A1 හා A2 දැන්වීම පරිදි එම අවස්ථාව වන විට අදාළ ඉල්ලීමක් කිරීමට සුදුසුකම් නොතිබූ බවට කිසිදු ප්‍රශ්න කිරීමක් සිදු කර නැත. ඉහත තනතුරට කිසිවෙකු බඳවා නොගත් බවට ඉල්ලුම්කරු ඉදිරිපත් කල කරුණු බිඳ හෙළීමට ද වගඋත්තකරු අපොහොසත් විය. වගඋත්තරකාර ආයතනයේ R1 අනුව බඳවා ගැනීම් සිදු කරනුයේ මානව සම්පත් අංශය බවද ඒ අනුව මානව සම්පත් අංශයේ කළමනාකරු සිය සාක්ෂියේ දී ඉහත ඉල්ලුම්පත් කැඳවන දිනය වන විට ඉල්ලුම්කරුට අවශ්‍ය සුදුසුකම නොතිබූ බවට කිසිදු සාක්ෂියක් මගින් තහවුරු කොට නොතිබුණි.

ඉල්ලුම්කරු සේවයට බැඳී ඇත්තේ R3 අනුව 1979.12.21 දින සිට බව තහවුරු විය. ඒ අනුව ඉල්ලුම්කරුට උසස්වීම් ලබා දීමට නිර්දේශ කළ 2006.01.01 දින වන විට ඉල්ලුම්කරුගේ සේවා කාලය අවුරුදු 26ක් වී තිබෙන බව ද පිළිගත හැකිය. 2006.01.01 දින සිට ඉල්ලුම්කරුට අධිකාරී විද්‍යුත් විධායක IV ශ්‍රේණිය ලබා දීමට නිර්දේශ කිරීමේ දී ඉල්ලුම්කරුගේ සේවා කාලය ඇතුලු තමා සම්බන්ධව සියලුම කරුණු සැලකිල්ලට ගෙන ඉහත A3b ලේඛනයේ සඳහන් තීරණය ලබා දුන් බව සිය කරුණු ඉදිරිපත් කරමින් ඉල්ලුම්කරු සඳහන් කර තිබුණි.

වගඋත්තරකරු අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලද R13, R14, R15 ලේඛනයට අනුව 2009.08.07 දින සිට අධිකාරී විද්‍යුත් IV ශ්‍රේණිය ක්‍රියාත්මක කිරීමට තීරණයක් ගෙන තිබූ බව පිළිගත හැකිය. මෙම තීරණය ගැනීමට පදනම් වූ කරුණු බේරුම්කරණයට ඉදිරිපත් කිරීමට වගඋත්තරු අපොහොසත් විය. 2006.01.01 දින සිට ඉල්ලුම්කරුට අධිකාරී විද්‍යුත් II ශ්‍රේණිය ලබා දෙන ලෙස නිර්දේශ කිරීමේ දී ඉල්ලුම්කරුට පුද්ගලික වන සේ අදාල නිර්දේශය කර තිබෙන බව ඉල්ලුම්කරු ලකුණු කරන ලද නිගමන අංක 83 වන A3a හා A3b ඡේද අනුව තහවුරු වේ.

ඉහත නිර්දේශය පරිදි අධිකාරී විද්‍යුත් II ශ්‍රේණිය ලබා දීමට 2009.08.07 දක්වා ප්‍රමාද කිරීමට හේතු බේරුම්කරණයට ඉදිරිපත් කර නොතිබුණි. ඉල්ලුම්කරුට පුද්ගලික වන සේ ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කර ඇත්තේ විශේෂ තත්වයන් සැලකිල්ලට ගෙන බව ද පිළිගත හැකිය. ඉහත කමිටුව විසින් නිර්දේශ කරන ලද යෝජනා කිහිපයක් හැර සෙසු යෝජනා ක්‍රියාත්මක කළ බව වගඋත්තරකරු සඳහන් කර තිබුණි.

මෙම බේරුම්කරණයේ පාර්ශවය අතර පවතින ආරවුල මෙසේ සඳහන්ව ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධිකාරී විද්‍යුත් විධායක (IV ශ්‍රේණිය) ලෙසට සේවය කරන ලද ජේ. එස්. පී. කොස්තා මහතාට 2006 වර්ෂයේ දී වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා පිහිටුවන ලද වරාය අධිකාරියේ වැටුප් හා සේවක කමිටුවේ නිර්දේශය අනුව 2006.01.01 දින සිට අධිකාරී විද්‍යුත් (II ශ්‍රේණිය) තනතුරු හා JLM වැටුප් තලය ලබා නොදීම හේතුවෙන් ඔහුට යම් අසාධාරණයක් සිදු වූයේ ද යන්න සහ එසේ වූයේ නම් සහන මොනවාද යන්න පිළිබඳව වේ. ඉල්ලුම්කරු විසින් ලකුණු කරන ලද නිගමන අංක 83 වන A3a හා B සටහනෙහි සඳහන් නියෝගය වන ජේ. එස්. පී. කොස්තා මහතාට අධිකාරී විද්‍යුත් තනතුර ලබා දීම 2006.01.01 දින සිදු කර නැත.

ඉල්ලුම්කරු කරන ලද රැකියාව තාක්ෂණික ශිල්පී තනතුරක් වන අතර ඒ අනුව ඉහත නියෝගය ක්‍රියාත්මක කිරීමේ දී ඇති වන ගැටලුව වැලැක්වීම සඳහා සාධාරණව කටයුතු කිරීම සේවා යෝජකගේ වගකීමක් වනු ඇත. ඉල්ලුම්කරු සේවය කරන ලද අංශයට හෝ ඒ හා සම්බන්ධ තීරණය ගන්නා ලද කිසිදු නිලධාරියෙකු මගින් ඉල්ලුම්කරුට 2009.08.07 දින සිට පත්වීම ක්‍රියාත්මක කිරීම, වඩාත් සුදුසු බව තහවුරු කිරීමට වගඋත්තරකරු බේරුම්කරණයේ දී අපොහොසත් විය. කමිටුවක් මගින් ගන්නා ලද අංක 83 දරන A3a හා b නිගමනයන් වෙනස් කිරීමට හේතු තිබිය යුතු ය. මෙවැනි ආරවුලක් ඇති වූ විටක එය නිරාකරණය කිරීමේදී ඊට අදළ තොරතුරු ලබා දීම අදළ පාර්ශ්වයේ වගකීම වේ. ඒ අනුව සේවායෝජක තනතුරු ලබා දීම ප්‍රමාද කිරීමට තුඩු දුන් හේතු ඉදිරිපත් කර නොතිබුණි. වගඋත්තරකරු බේරුම්කරණයට කැඳවන ලද සාක්ෂිකරුගේ සාක්ෂිය අනුව ඔහුට මෙම පත්වීම ප්‍රමාද කිරීමේ තීරණයක් ගත නොහැකි බව පිළිගත හැකිය. ඉල්ලුම්කරු සම්බන්ධයෙන් ඉහත උසස්වීම 2009.08.07 දින ක්‍රියාත්මක කිරීම සඳහා R1 ලේඛනය පරිදි ආයතනය තුළ පවත්නා ක්‍රමවේදය අනුව වගඋත්තරකරු කටයුතු කර ඇතත් 2006.01.01 දින සිට උසස්වීම් ලබා දීම කර තිබූ නිර්දේශය 2009.08.07 දින දක්වා ප්‍රමාද කිරීමට සාධාරණ හා යුක්ති සහගත හේතූන් තිබූ බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව තහවුරුව නැති බව මම නිගමනය කරමි.

බේරුම්කරණයට වගඋත්තරකරු ඉදිරිපත් කළ සාක්ෂි අනුව 2006.01.01 දින සිට අධිකාරී විද්‍යුත් විධායක (IV ශ්‍රේණිය) 2009.08.07 දක්වා ප්‍රමාද කිරීමට සාධාරණ හා යුක්ති සහගත හේතු තිබූ බව තහවුරුව නැති හෙයින් ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදුව ඇති බව මම නිගමනය කරමි.

ඉල්ලුම්කරුට ඒ පිළිබඳව ලබා දිය යුතු සහනය කුමක් ද ඊ ලඟට විමසා බැලිය යුතු ය. ඉල්ලුම්කරුට ඉහත තනතුර ලැබී ඇත්තේ 2009.08.07 දින සිට ය. ඒ අනුව 2006.01.01 දිනයේ සිට ඉල්ලුම්කරු ඉහත තනතුරේ පිහිටුවා එකී තනතුරට හිමි වැටුප් ලබා දෙන ලෙසත් ඒ අනුව අදළ කාලයට හිමි වැටුප් ලබා දීම සුදුසු බව මම නිගමනය කරමි.

ඉල්ලුම්කරු සිය සාක්ෂියේ දීම තමාට හිමි විය යුතු වැටුප් විස්තරවලට අදළ ලේඛනයේ A7 වශයෙන් ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණි.

එකී ලේඛනය පරිදි 2006.01.01 දිනය වන විට සහකාර අධිකාරී තනතුරේ සිට ඇති අතර ඔහුගේ වැටුප්තලය SG1 වන අතර ඒ අනුව වැටුප රු. 21,600 වන අතර වගඋත්තරකරු මගින් දෙන ලද

A4 ලේඛනය අනුව ද ඉල්ලුම්කරු සඳහන් කළ කරුණු අනුව ද නිවැරිදි බව පිළිගත හැකිය.

රු. 21,600 වැටුප පදනම් කොටගෙන ඉල්ලුම්කරු 2006.01.01 වන විට වැටුප් තලය රු. 25,000 බව A6 ලේඛනය පදනම් කොට ඉල්ලම්කරු ඉදිරිපත් කළ අතර වගඋත්තරකරු ප්‍රතික්ෂේප කළ ද ඔහු සතු ලේඛන මගින් එම කරුණු තහවුරු කොට නැත. වගඋත්තරකරු සතු ලේඛනයක පිටපතක් A6 වශයෙන් ලකුණු කර තිබූ අතර එය ප්‍රතික්ෂේප කිරීමක් ද සිදු කොට නොතිබුණි. රු. 25,000/- වැටුප් තලය වැරදි බව ප්‍රකාශ කළ ද එය නිවැරදිව තහවුරු කිරීමට වගඋත්තරකරු අපොහොසත් විය. ඉහත සඳහන් සියලු කරුණු සැලකිල්ලට ගෙන 2006.01.01 දින සිට අධිකාරි විද්‍යුත් IV ශ්‍රේණිය ලබා නොදීම පදනම් කොට පහත සඳහන් පරිදි හිඟ වැටුප් ලබා දෙන ලෙස ඉහත වගඋත්තරකරුට මම නියම කරමි. 2006.01.01 දින සිට JLM වැටුප් තලය වන රු. 25,000ක් මත පදනම්ව මෙම හිඟ වැටුප් ගණනය කරමි.

1. වැටුප මත පදනම්ව හිඟ වැටුප් 25,000-21,600
හිඟ මුදල : රු. 3,400 = 2006 වසර සඳහා රු. 40,800
(3,400 x 12)

2007 වැටුප් වර්ධකයේ වෙනස රු. 100/-
ඒ අනුව අදළ වර්ෂයට හිඟ වැටුප } රු. 42,000
(3,400 + 100 x 12) 3,500 x 12
2008 (3500 + 100 x 12) වැටුප් වර්ධකය සමග 43200
2009 - අගෝස්තු දක්වා 3600 + 100 x 8 = 29600

ඉහත කාලයට වැටුප - 155600/-
JLM තනතුර පරිදි - 155600/- කි.

ඉල්ලුම්කරු A7 ලේඛනය මගින් 2013 මැයි දක්වා අහිමි වූ වැටුප පිළිබඳව කරුණු ඉදිරිපත් කර ඇති අතර ඉල්ලුම්කරු ඒ වන විට සේවයේ සිටි බව ප්‍රකාශ කළ හෙයින් විශ්‍රාම ගන්නා තෙක් ඉහත පරිදි වැටුප් ගණනය කිරීමක් සිදු විය යුතු බවද පිළිගත හැකිය. ඉල්ලුම්කරු අධිකාරි විද්‍යුත් II ශ්‍රේණියට වගඋත්තරකරු දී ඇත්තේ 2009.08.07 ඉල්ලුම්කරු ද පිළිගෙන තිබූ අතර ඒ අනුව A7 ලේඛනය පරිදි 2009 වසරේ අගෝස්තු 07 දිනය දක්වා අදාළ වැටුප ගණනය කර තිබූ බව පිළිගත හැකිය. මෙම ආරවුල අවසන් වන දිනය වන විට ඉල්ලුම්කරු සේවයේ යෙදී සිටින බව සඳහන් කර තිබුණි. එසේම ඔහු විශ්‍රාම ගත යුතු දිනය බේරුම්කරණය වෙත ඉදිරිපත් කොට නොතිබුනි. ඒ අනුව 2009 අගෝස්තු මාසයේ සිට සම්පූර්ණ කාලයට හිමි හිඟ වැටුප් ලබා ගැනීමේ අයිතිය ඉල්ලුම්කරුට හිමි වේ. ඉල්ලුම්කරු විශ්‍රාම ගොස් ඇත්නම් අවසන් වැටුප මත පදනම්ව ව්‍යවස්ථාපිත හිමිකම් ලබා ගැනීමේ අයිතිය ඉල්ලුම්කරුට ඇත. ඉල්ලුම්කරු සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් ගණනය කර ඇතත් එය ව්‍යවස්ථාපිත හිමිකමක් වන හෙයින් එකී මුදල් ඉල්ලුම්කරුට ලබා ගැනීමේ අයිතියට අගති රහිතව මෙම ප්‍රදානය සිදු කරනු ඇත.

ඒ අනුව ඉහත සඳහන් සියලුම කරුණු සැලකිල්ලට ගෙන ඉල්ලුම්කරු 2006.01.01 දින සිට JLM තනතුරේ පිහිටුවා ඒ අනුව හිඟ වැටුප් ලබා දීම සුදුසු වන හෙයින් 2006.01.01 දින සිට විධායක ශ්‍රේණියේ JLM තනතුරෙහි පිහිටුවා 2009 අගෝස්තු දක්වා අහිමි වූ මුළු වැටුප වන රු. 155600/- ක මුදලක් ඉල්ලුම්කරුට ලබා දෙන ලෙසත් 2009.08.07 දින සිට ඔහුට හිමි වැටුප් වර්ධක නියමාකාරයට ලබා දෙන ලෙසත් එසේම සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු බැර කිරීම් කරන ලෙසත් ඉල්ලුම්කරුට ගෙවිය යුතු මුදල වන රු.155600/- ක මුදල හා වැටුප් වර්ධක නිවැරදිව ගණන් බලා මෙම නියෝගය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් අනතුරුව මාස දෙකක් තුළ දී සහකාර කම්කරු කොමසාරිස් කොළඹ දකුණ මගින් ගෙවන ලෙසත් ඉහත වගඋත්තරකරුට මම නියම කරමි. මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් වන හෙයින් මෙසේ ප්‍රකාශයට පත් කරමි.

පාලිත වීරසේකර,
බේරුම්කරු.

2016.03.31

08 - 660

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.